නිපුනතාව 16.0 - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත සඵලදායකව සහ කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු විමසයි.

නිපුනතා මට්ටම 16.9 විනය කළමණාකරණයේ වැදගත්කම විමසයි.

## විනය

ව්‍යාපාර සංවිධානයක් විධිමත්ව නීත්‍යානුකූලව පවත්වගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සම්මත හැසිරීම විනය ලෙස හඳුන්වයි.

නැතහොත්, සේවයෝජක අපේක්ෂිත, සේවාදායකයන්ගේ චර්යාව හෙවත් අපේක්ෂිත හැසිරීම විනය ලෙස හඳුන්වයි.

## විනය කළමණාකරණය

ව්‍යාපාර සංවිධානයක් ස්ථාපිත කර තිබෙන නීති රීතිවලට අනුගත වන පරිදි සේවාදායකයන්ගේ චර්යාව හැඩගැස්වීමේ කාර්ය සඳහා යෝග්‍ය විනය නීතිරීති පද්ධතියක් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වගෙනයාම විනය කළමණාකරණය ලෙස හැදින්වේ.

## ව්‍යාපාර සංවිධානවල බහුලව දැකියහැකි විනය විරෝධී ක්‍රියා/ විශමාචාර

- ආයතනයේ දේපලවලට හිතාමතා හානි සිදු කිරීම.
- පූර්ව අවසරයකින් තොරව සේවයට වාර්තා නොකිරීම.
- ප්‍රමාද වී සේවයට පැමිණීම.
- රැකිය ස්ථානයෙන් අවසර නොමැතිව බැහැර වීම.
- ව්‍යාජ අසනීප ගති පෙන්වීම.
- සේවයේ යෙදී සිටියදී නිදා ගැනීම.
- රැකියා කටයුතු පිලිබඳ නොසැලකිල්ල හා මන්දෝත්සාහී වීම,
- ස්ථාපිත කර ඇති ආරක්ෂිත හා සෞඛ්‍ය ක්‍රමවලට බාධා කිරීම.

- සේවා නියුක්තව සිටින විට මත්වතුර හෝ මත් ද්‍රව්‍ය භාවිතා කිරීම.
- මුදල් වංචා කිරීම හෝ අල්ලස් ගැනීම.
- ප්‍රධානියා තම සේවකයන්ට අපහාස කිරීම හෝ තර්ජනය කිරීම.

## විනය ක්‍රියාමාර්ග

- වාචිකව අවවාද කිරීම.
- ලිඛිතව අවවාද කිරීම.
- දඩ ගැසීම හෝ අලාභය අය කර ගැනීම.
- වේතන රහිතව තාවකාලිකව වැඩ නතර කිරීම.
- විනයානුකූලව සේව ස්ථානය මාරු කිරීම.
- වැටුප් වර්ධක නතර කිරීම හෝ ප්‍රමාද කිරීම.
- තනතුරෙන් පහත හෙලීම.
- සේවයෙන් ඉවත් කිරීම.

## විනය කළමණාකරණයේ වැදගත්කම

- සේවකයන් අතර ගැටුම් මතභේද අඩු කර ගැනීමට.
- සේව්‍ය හා සේවකයන් අතර පවත්නා මතභේද අඩු කර ගැනීමට.
- ආයතනය සතු මානව සම්පත ක්‍රමානුකූලව හා මනාව පාලනය කිරීම මඟින් උපරිම සඵලදායකත්වයෙන් හා කාර්යක්ෂමතාවයෙන් කටයුතු සිදු කිරීමට හැකි වීම.
- සංවිධානයේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව සේවක හැසිරීම් පවත්වා ගැනීමට.
- අපේක්ශිත සේවක කාර්යසාධනය බිහිකර ගැනීමට හා එය අඛණ්ඩව පවත්වා ගැනීමට.

## ප්‍රශ්න

1) විනය කළමණාකරණය යන්න හඳුන්වන්න,
2) වින කළමණාකරණය ආයතනයකට වැදගත් වන්නේ ඇයි?
3) ආයතනයක සිදුවියහැකි විනය විරෝධී ක්‍රියා මොනවාද?
4) විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ආයතනයකට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?